# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,637 - 2010 ජනවාරි මස 15 වැනි සිකුරාදා - 2010.01.15**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | 354 |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | — |
| පළාත් සභා විවිධ දැන්වීම් ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | 356 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියළුම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2010 ජනවාරි මස 22 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2010 ජනවාරි මස 08 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2010 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

353 - B 080086— 7,130 (2010/01)
F1-

# ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

**1987 අංක 42 දරන පළාත් සභා පනතේ IV වැනි කොටසේ 32(1) වගන්තිය යටතේ වයඹ පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් කරන ලද පත් කිරීම්**

| *අනු. අංකය* | *නම/සේවය/පන්තිය/ශ්‍රේණිය* | *පත්කරන ලද තනතුර/කාර්යාලය/ක්‍රියාත්මක වන දිනය* |
|---|---|---|
| 01 | කමල් අමරසිංහ මහතා<br>ශ්‍රී. ලං.ප. සේ. III පන්තිය | 2009.11.12 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි වාරියපොල වයඹ පුහුණු ආයතනයේ අධ්‍යක්‍ෂ තනතුරේ පූර්ණකාලීනව වැඩ බැලීම සඳහා |
| 02 | එම්. එම්. සිල්වා මහතා<br>ශ්‍රී. ලං.අ.ප.සේ. II පන්තිය | 2009.10.28 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි වයඹ ප්‍රධාන අමාත්‍යාංශයේ සහකාර ලේකම් (අධ්‍යාපන) තනතුර සඳහා |
| 03 | එම්. ඒ. එම්. අනීස් මහතා<br>ශ්‍රී. ලං. අ.ප.සේ. III පන්තිය | 2009.11.09 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි පුත්තලම, කළාප අධ්‍යාපන කාර්යාලයේ සහකාර අධ්‍යාපන අධ්‍යක්‍ෂ (ගණිත) තනතුර සඳහා |
| 04 | එන්. ඒ. වී. සෝමසිරි මහතා<br>ශ්‍රී. ලං. අ.ප.සේ. III පන්තිය | 2009.11.09 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි ගිරිඋල්ල කළාප අධ්‍යාපන කාර්යාලයේ සහකාර අධ්‍යාපන අධ්‍යක්‍ෂ (ගණිත) තනතුර සඳහා |
| 05 | ඩී. එම්. ඒ. පී. දිසානායක මිය.<br>ශ්‍රී. ලං. අ.ප.සේ. III පන්තිය | 2009.11.09 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි නිකවැරටිය කළාප අධ්‍යාපන කාර්යාලයේ සහකාර අධ්‍යාපන අධ්‍යක්‍ෂ (විද්‍යා) තනතුර සඳහා |
| 06 | ඩී. ඩබ්. එම්. එච්. ඩබ්. අයි. කේ. සෙනෙවිරත්න මහතා<br>ශ්‍රී. ලං. අ.ප.සේ. III පන්තිය | 2009.11.09 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි ගිරිඋල්ල කළාප අධ්‍යාපන කාර්යාලයේ සහකාර අධ්‍යාපන අධ්‍යක්‍ෂ (විද්‍යා) තනතුර සඳහා |
| 07 | ආර්. ඩී, එන්. පී. චන්ද්‍රසේන මිය .<br>ශ්‍රී. ලං. අ.ප.සේ. III පන්තිය | 2009.11.09 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි පුත්තලම කළාප අධ්‍යාපන කාර්යාලයේ සහකාර අධ්‍යාපන අධ්‍යක්‍ෂ (විද්‍යා) තනතුර සඳහා |
| 08 | බී. එම්. එස්. එස්. කුමාරි මිය.<br>ශ්‍රී. ලං. අ.ප.සේ. III පන්තිය | 2009.11.09 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි කුලියාපිටිය කළාප අධ්‍යාපන කාර්යාලයේ සහකාර අධ්‍යාපන අධ්‍යක්‍ෂ (විද්‍යා) තනතුර සඳහා |
| 09 | ඩී. එන්. රණසිංහ මිය.<br>ශ්‍රී. ලං. අ.ප.සේ. III පන්තිය | 2009.11.09 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි කුලියාපිටිය කළාප අධ්‍යාපන කාර්යාලයේ සහකාර අධ්‍යාපන අධ්‍යක්‍ෂ (කෘෂි විද්‍යා) තනතුර සඳහා |
| 10 | එම්. ඩබ්. එස්. ප්‍රියංගිකා මිය.<br>ශ්‍රී. ලං. අ. ප. සේ. III පන්තිය | 2009.11.09 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි ඉබ්බාගමුව කළාප අධ්‍යාපන කාර්යාලයේ සහකාර අධ්‍යාපන අධ්‍යක්‍ෂ (කෘෂි විද්‍යා) තනතුර සඳහා |
| 11 | සී. පී. පී. පී. පතිරණ මිය.<br>ශ්‍රී. ලං. අ. ප. සේ. III පන්තිය | 2009.11.09 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි පුත්තලම කළාප අධ්‍යාපන කාර්යාලයේ සහකාර අධ්‍යාපන අධ්‍යක්‍ෂ (පෙරදිග සංගීතය) තනතුර සඳහා |
| 12 | එම්. එච්. එන්. තරංගනී මිය.<br>ශ්‍රී. ලං. අ. ප. සේ. III පන්තිය | 2009.11.09 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි නිකවැරටිය කළාප අධ්‍යාපන කාර්යාලයේ සහකාර අධ්‍යාපන අධ්‍යක්‍ෂ (විශේෂ අධ්‍යාපන) තනතුර සඳහා |
| 13 | වයි. බී. එම්. එච්. ඊ. ජයසිංහ මිය.<br>ශ්‍රී. ලං. අ. ප. සේ. III පන්තිය | 2009.11.09 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි හලාවත කළාප අධ්‍යාපන කාර්යාලයේ සහකාර අධ්‍යාපන අධ්‍යක්‍ෂ (ඉංග්‍රීසි) තනතුර සඳහා |
| 14 | ටී. එම්. ඒ. එස්. තෙන්නකෝන් මිය.<br>ශ්‍රී. ලං. අ. ප. සේ. III පන්තිය | 2009.11.09 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි නිකවැරටිය කළාප අධ්‍යාපන කාර්යාලයේ සහකාර අධ්‍යාපන අධ්‍යක්‍ෂ (ඉංග්‍රීසි) තනතුර සඳහා |
| 15 | ඒ. එම්. ඩබ්. එස්. ඒ. ජයරත්න මිය.<br>ශ්‍රී. ලං. අ. ප. සේ. III පන්තිය | 2009.11.09 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි පුත්තලම කළාප අධ්‍යාපන කාර්යාලයේ සහකාර අධ්‍යාපන අධ්‍යක්‍ෂ (ඉංග්‍රීසි) තනතුර සඳහා |
| 16 | බී. එම්. ඒ. යූ. බණ්ඩාරනායක මිය.<br>ශ්‍රී. ලං. අ. ප. සේ. III පන්තිය | 2009.11.09 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි මහව කළාප අධ්‍යාපන කාර්යාලයේ සහකාර අධ්‍යාපන අධ්‍යක්‍ෂ (සැළසුම්) තනතුර සඳහා |
| 17 | සී. එම්. එන්. රණසිංහ මෙනවිය<br>ශ්‍රී. ලං. අ. ප. සේ. III පන්තිය | 2009.11.09 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි කුලියාපිටිය කළාප අධ්‍යාපන කාර්යාලයේ සහකාර අධ්‍යාපන අධ්‍යක්‍ෂ (සැළසුම්) තනතුර සඳහා |
| 18 | ඩබ්. එස්. එස්. ආර්. ප්‍රනාන්දු මෙනෙවිය<br>ශ්‍රී. ලං. අ. ප. සේ. III පන්තිය | 2009.11.09 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි නිකවැරටිය කළාප අධ්‍යාපන කාර්යාලයේ සහකාර අධ්‍යාපන අධ්‍යක්‍ෂ (තොරතුරු තාක්‍ෂණය) තනතුර සඳහා |

| *අනු. අංකය* | *නම/සේවය/පන්තිය/ශ්‍රේණිය* | *පත්කරන ලද තනතුර/කාර්යාලය/ක්‍රියාත්මක වන දිනය* |
|---|---|---|
| 19 | වී. අයි. වී. එස්. විදානපතිරණ මිය.<br>ශ්‍රී. ලං. අ. ප. සේ. III පන්තිය | 2009.11.09 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි පුත්තලම කලාප අධ්‍යාපන කාර්යාලයේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (භාෂා මානව ශාස්ත්‍ර) තනතුර සඳහා |
| 20 | ඒ. එම්. ඩී. වැදණ්ඩ මිය.<br>ශ්‍රී. ලං. අ. ප. සේ. III පන්තිය | 2009.11.09 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි නිකවැරටිය කලාප අධ්‍යාපන කාර්යාලයේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (අධ්‍යාපන පරිපාලන) තනතුර සඳහා |
| 21 | එම්. ඒ. ඩී. මංජුලා මිය.<br>ශ්‍රී. ලං. අ. ප. සේ. III පන්තිය | 2009.11.09 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි පුත්තලම කලාප අධ්‍යාපන කාර්යාලයේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (අධ්‍යාපන පරිපාලන) තනතුර සඳහා |
| 22 | එස්. බී. බී. පී. එම්. පී. එස්. කහවත්ත මිය.<br>ශ්‍රී. ලං. අ. ප. සේ. III පන්තිය | 2009.11.09 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි ඉබ්බාගමුව කලාප අධ්‍යාපන කාර්යාලයේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (ප්‍රාථමික) තනතුර සඳහා |
| 23 | අයි. එන්. වීරසූරිය මිය.<br>ශ්‍රී. ලං. අ. ප. සේ. III පන්තිය | 2009.11.09 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි ගිරිඋල්ල කලාප අධ්‍යාපන කාර්යාලයේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (අධ්‍යාපන පරිපාලන) තනතුර සඳහා |
| 24 | එල්. එස්. ආර්. ජයසිංහ මිය.<br>ශ්‍රී. ලං. අ. ප. සේ. III පන්තිය | 2009.11.09 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි කුරුණෑගල කලාප අධ්‍යාපන කාර්යාලයේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (සංවර්ධන) තනතුර සඳහා |
| 25 | එස්. නන්දාවතී මිය.<br>ශ්‍රී. ලං. අ. ප. සේ. III පන්තිය | 2009.11.09 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි ගිරිඋල්ල කලාප අධ්‍යාපන කාර්යාලයේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (සංවර්ධන) තනතුර සඳහා |
| 26 | එච්. එම්. එස්. රංජනී මිය.<br>ශ්‍රී. ලං. අ. ප. සේ. III පන්තිය | 2009.11.09 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි ගිරිඋල්ල කලාප අධ්‍යාපන කාර්යාලයේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (වාණිජ) තනතුර සඳහා |
| 27 | ඩබ්. එස්. එස්. ආර්. එම්. එස්. එස්. විජේසේකර මහතා<br>ශ්‍රී. ලං. අ.ප.සේ. III පන්තිය | 2009.11.09 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි කුලියාපිටිය කලාප අධ්‍යාපන කාර්යාලයේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (චිත්‍ර) තනතුර සඳහා |
| 28 | කේ. ජී. එල්. නිරේෂා මිය.<br>ශ්‍රී. ලං. අ. ප. සේ. III පන්තිය | 2009.11.09 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි නිකවැරටිය කලාප අධ්‍යාපන කාර්යාලයේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (ගණිත) තනතුර සඳහා |
| 29 | බී. සී. එස්. විජේසිංහ මහතා<br>ශ්‍රී. ලං. අ. ප. සේ. III පන්තිය | 2009.11.10 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි ඉබ්බාගමුව කලාප අධ්‍යාපන කාර්යාලයේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (සමාජ අධ්‍යයනය) තනතුර සඳහා |
| 30 | ඒ. කේ. තිස්ස අතුකෝරල මහතා<br>ශ්‍රී. ලං. අ. ප. සේ. III පන්තිය | 2009.11.10 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි කුලියාපිටිය කලාප අධ්‍යාපන කාර්යාලයේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (ගණිත) තනතුර සඳහා |
| 31 | එච්. එම්. එස්. ඩී. හේරත් මිය.<br>ශ්‍රී. ලං. අ. ප. සේ. III පන්තිය | 2009.11.10 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි ඉබ්බාගමුව කලාප අධ්‍යාපන කාර්යාලයේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (සංගීතය) තනතුර සඳහා |
| 32 | යූ. එච්. පියසීලි මිය.<br>ශ්‍රී. ලං. අ. ප. සේ. III පන්තිය | 2009.11.10 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (විද්‍යා) තනතුර සඳහා |
| 33 | පී. එම්. ඩී. එස්. අබේවික්‍රම මිය.<br>ශ්‍රී. ලං. අ. ප. සේ. III පන්තිය | 2009.11.10 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (කෘෂි විද්‍යා) තනතුර සඳහා |
| 34 | බී. එම්. කේ. ජී, බාලසූරිය මහතා<br>ශ්‍රී. ලං. තා. සේ. (විශේෂ ශ්‍රේණිය) | 2009.10.05 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි වයඹ පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ, දිස්ත්‍රික් ඉඩම් නිලධාරි/සහකාර ඉඩම් කොමසාරිස් (දෙපාර්තමේන්තුමය) තනතුර සඳහා. |

ගරු ආණ්ඩුකාරතුමාගේ නියමය පරිදි,

ආර්. ඒ. තිලකරත්න,
වයඹ ආණ්ඩුකාරවර ලේකම්.

2009 දෙසැම්බර් මස 16 වැනි දින,
වයඹ ආණ්ඩුකාරවර කාර්යාලය.

01-378

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**පළාත් පාලන දෙපාර්තමේන්තුව - මධ්‍යම පළාත**

මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල තනතුරු පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් - 2009, *ගැසට් නිවේදනය* සංශෝධනය කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2009.11.13 දිනැති IV (අ) වැනි කොටස - පළාත් සභා *ගැසට් නිවේදනයේ* 1784 පිටු අංකයේ සිට පළ කරන ලද පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල තනතුරු පුරප්පාඩු සඳහා බඳවා ගැනීම - 2009 *ගැසට් නිවේදනය* පහත සඳහන් පරිදි සංශෝධනය කෙරේ. එම සංශෝධනවලට අනුව ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කරන ලෙස මෙයින් දන්වනු ලැබේ. ඉහත *ගැසට් නිවේදනය* අනුව දැනටමත් ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් නැවත අයදුම් කිරීම අවශ්‍ය නොවේ.

**මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල තනතුරු පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් - 2009**

මධ්‍යම පළාතේ, පහත සඳහන් පළාත් පාලන ආයතනවල පවතින පහත පුරප්පාඩු තනතුරු සඳහා මධ්‍යම පළාත තුළ ස්ථිර පදිංචිකරුවන් වන ශ්‍රී ලාංකීය පුරවැසියන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

* ආදායම් පරීක්ෂක සේවය - III වන ශ්‍රේණිය
* පුස්තකාලයාධිපති - III ශ්‍රේණිය
* ළදරු පාසැල් පාලිකා - II ශ්‍රේණිය

02. බඳවාගැනීම් සිදු කරන අවස්ථාවේදී බඳවා ගන්නා සංඛ්‍යාව තීරණය කිරීමේ බලය මධ්‍යම පළාතේ පළාත් පාලන කොමසාරිස් සතු වේ.

03. *මූලික සුදුසුකම්* :

(i) අයදුම්කරුවන් ශ්‍රී ලාංකීය පුරවැසියන් විය යුතුය.
(ii) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට එනම් 2010.02.15 දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතුය. (මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල ස්ථිර තනතුරු දරන නිලධාරීන්ට මෙම උපරිම වයස් සීමාව බල නොපායි.)
(iii) අයදුම්කරුවන් මධ්‍යම පළාත තුළ ස්ථිර පදිංචිකරුවන් විය යුතුය. (අයදුම්පත් කැඳවනු ලබන අවසන් දිනට පූර්වාසන්න වසර 03ක කාලය තුළ ස්ථිර පදිංචිය සම්මුඛ පරීක්ෂණයේ දී ඡන්ද හිමි නාමලේඛනය මගින් තහවුරු කළ යුතුය.

04. *වැටුප් පරිමාණ/අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම්/බඳවා ගැනීමේ ක්‍රමය* :

01. පුස්තකාලයාධිපති III ශ්‍රේණිය
01.01 *වැටුප් පරිමාණය*.- 6/2006(IV) අනුව - එම් එන් 03 - රු. 15,005-4 x 180 - 6 x 240 - 11 x 320 - රු. 27,885.

01.02 *අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම්* :
01.02.01 විවෘත බඳවා ගැනීම් :

(අ) අ.පො.ස. (සා. පෙළ) විභාගයේදී හෝ ඊට සමාන විභාගයකදී සිංහල/දෙමළ භාෂාව ; හා අංක ගණිතය/මූලික ගණිතය/ශුද්ධ ගණිතය/ගණිතය යන විෂයයන්ගෙන් එකක් ද ඇතුළුව තවත් විෂයයන් 04කට සම්මාන සහිතව විෂයයන් 06කින් සමත්වීම අවශ්‍ය වේ. මෙයින් විෂයයන් 05ක් එකවර සමත් වී තිබිය යුතුය ; සහ
(ආ) අ.පො.ස. (උ.පෙළ) විභාගයේදී ඕනෑම විෂයයන් 03කින් සමත්වීම. ඉහත අ, ආ හි සඳහන් අධ්‍යාපන සුදුසුකම් සහිතව
(ඇ) ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ ප්‍රථම පරීක්ෂණයෙන් ; හෝ
(ඉ) ශ්‍රී ලංකාව තුළ පිළිගත් විශ්වවිද්‍යාලයක පුස්තකාල විද්‍යා සහතික පත්‍ර පරීක්ෂණයේ 01 කොටසින් සමත්ව වෘත්තීය සුදුසුකම් ලබා සිටීම.

01.02.02 *සීමිත බඳවා ගැනීම්* :

(අ) 1997.08.01 දිනට හෝ ඊට පෙර පුස්තකාල සහයක/සේවක ලෙස සේවයට බැඳුණු අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් :-

* පළාත් පාලන ආයතනයක පුස්තකාලයක් භාරව එහි පුස්තකාල සහයක/සේවක වශයෙන් අවුරුදු 10කට නොඅඩු කාලයක අඛණ්ඩ සේවයක් තිබීම ; හා
* සිංහල/දෙමළ භාෂාව හා තවත් විෂයයන් 02කට සම්මාන සාමාර්ථ සහිතව ගණිතය/අංක ගණිතය/වාණිජ අංක ගණිතය ඇතුළු විෂයයන් 06කින් දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගය සමත්ව තිබීම ; හා
* ඉංග්‍රීසි පිළිබඳ සාමාන්‍ය දැනීමක් තිබීම.

(ආ) 1997.08.02 දින හෝ එයට පසු පුස්තකාල සහයක/සේවක ලෙස සේවයට බැඳුණු අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් : ඉහත 01.02.01 හි (අ) හා (ආ) යටතේ ඇති අධ්‍යාපන සුදුසුකම් සපුරාලන හා මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පුස්තකාල සහයක/සේවක තනතුරේ ස්ථිර කරන ලද වසර 10ක සතුටුදායක සේවා කාලයක් ඇති සේවකයෙකු වීම.

01.03 *බඳවා ගැනීමේ ක්‍රමය.-* පවතින පුරප්පාඩු සංඛ්‍යාවෙන් 75%ක් විවෘත තරග විභාගයේ ප්‍රතිඵල මත ද 25%ක් සීමිත තරග විභාගයේ ප්‍රතිඵල මත ද බඳවාගනු ලැබේ. ලිඛිත තරග විභාගයේ සුදුසුකම් ලබන්නන්ගේ ප්‍රතිඵල මත ප්‍රමුඛතා පරිදි කැඳවනු ලබන සම්මුඛ පරීක්ෂණයක් මගින් මූලික අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සනාථ කර ගැනීමෙන් පසු රජයේ ප්‍රතිපත්ති හා නියමයන් අනුගමනය කරමින් පුරප්පාඩු පුරවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබාදීමක් සිදු නොකරේ. පත්වීම් ප්‍රදානයේදී පත්වීම් දියයුතු අවසාන ප්‍රමුඛතාවය ලබාගන්නාගේ ලකුණුවලට සමාන කීපදෙනෙකු සිටින අවස්ථාවකදී සම්මුඛ පරීක්ෂණයකින් අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් අනුව ඉහළම සුදුසුකම් ඇති පුද්ගලයා තෝරා ගැනේ.

*ලිඛිත තරග විභාගයේ විෂය නිර්දේශය.-* විවෘත හා සීමිත තරග විභාග සඳහා පහත සඳහන් ප්‍රශ්න පත්‍රවලින් සමන්විත ලිඛිත විභාගයක් පැවැත්වේ.

| | | |
|---|---|---|
| (i) සාමාන්‍ය දැනීම | කාලය පැය 01 | ලකුණු 100 |
| (ii) පුස්තකාල විද්‍යාව පිළිබඳ දැනුම | කාලය පැය 02 | ලකුණු 100 |

විභාගය සමත්වීම සඳහා එක් විෂයයකට අවම වශයෙන් ලකුණු 40% ලබාගත යුතුය.

02. ආදායම් පරීක්ෂක සේවය - III වැනි ශ්‍රේණිය

02.01 *වැටුප් පරිමාණය.-* රා. ප. ච. ලේ. 06/2006(IV)MN-1 හි වැටුප් පරිමාණයන් අනුව වාර්ෂික ඒකාබද්ධ රු. 157,440-1,740 x 10 - රු. 174,840.

02.02 *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :*

02.02.01 විවෘත බඳවා ගැනීම්

(i) සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව හා ගණිතය/අංක ගණිතය/වාණිජ අංක ගණිතය යන විෂයයන් ඇතුළුව විෂයයන් 05කට සම්මාන සාමාර්ථයන් සහිතව හා ඉංග්‍රීසි විෂයයට සාමාර්ථයක් ද සහිතව විෂයයන් 06කින් දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යාපන පොදු සහතික පත්‍ර විභාගය/ජාතික පොදු අධ්‍යයන සහතික පත්‍ර විභාගය සමත්වීම ; සහ

(ii) අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයෙන් ගණකාධිකරණය වාණිජ්‍ය හා මූල්‍ය ආර්ථික විද්‍යාව, ව්‍යවහාරික ගණිතය, සංයුක්ත ගණිතය, ශුද්ධ ගණිතය යන විෂයයන් දෙකක් ඇතුළත්ව විෂයයන් 03කින් සමත් වීම.

02.02.02 *සීමිත බඳවා ගැනීම් :*

1. සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව හා ගණිතය/අංක ගණිතය/වාණිජ අංක ගණිතය යන විෂයයන් ඇතුළුව විෂයයන්ට සම්මාන සාමාර්ථයන් සහිතව හා ඉංග්‍රීසි විෂයයට සාමාර්ථයක් ද සහිතව විෂයයන් 06කින් දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යාපන පොදු සහතික පත්‍ර විභාගය/ජාතික පොදු අධ්‍යයන සහතික පත්‍ර විභාගය සමත් වීම ; සහ

2. පහත දක්වා ඇති තනතුරක අයදුම්පත් කැඳවනු ලබන අවසන් දිනට වසර 5ක සතුටුදායක සේවා කාලයක් ඇති තනතුරෙහි ස්ථිර කර ඇති සේවකයෙකු වීම :-
   * වෙළඳසැල් පරිපාලක
   * පොළ පරිපාලක
   * ආදායම් ඕවසියර්
   * උද්‍යාන භාරකරු/පරිපාලක
   * ක්‍රීඩාංගන භාරකරු/පරිපාලක
   * සතිපොල භාරකරු/පරිපාලක

02.03 *බඳවා ගැනීමේ ක්‍රමය.-* පවතින පුරප්පාඩු සංඛ්‍යාවෙන් 70%ක් විවෘත තරග විභාගයේ ප්‍රතිඵල මත ද 30%ක් සීමිත තරග විභාගයේ ප්‍රතිඵල මත ද බඳවා ගනු ලැබේ. තරග විභාගයේ ප්‍රතිඵල මත ප්‍රමුඛතා පරිදි කැඳවනු ලබන සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුසුකම් සනාථ කර ගැනීමෙන් පසු රජයේ ප්‍රතිපත්ති හා නියමයන් අනුගමනය කරමින් පුරප්පාඩු පුරවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ. පත්වීම් ප්‍රදානයේදී පත්වීම් දිය යුතු අවසාන ප්‍රමුඛතාවය ලබාගන්නාගේ ලකුණුවලට සමාන කීප දෙනෙකු සිටින අවස්ථාවකදී සම්මුඛ පරීක්ෂණයකින් අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් අනුව ඉහළම සුදුසුකම් ඇති පුද්ගලයා තෝරා ගැනේ.

02.03.01 *විෂය නිර්දේශය.-* විභාගය සමත්වීම සඳහා එක් විෂයයකට අවම වශයෙන් ලකුණු 40% ලබාගත යුතුය.

02.03.01.01 විවෘත ලිඛිත තරග විභාගයේ විෂය නිර්දේශය.- විවෘත විභාගය සඳහා පහත සඳහන් ප්‍රශ්න පත්‍රවලින් සමන්විත විභාගයක් පැවැත්වේ.

| | | |
|---|---|---|
| භාෂා හැකියාව | කාලය පැය 01 1/2 | ලකුණු 100 |
| අභියෝග්‍යතාව | කාලය පැය 01 | ලකුණු 100 |

විභාගය සමත්වීම සඳහා එක් විෂයයකට අවම වශයෙන් ලකුණු 40% ලබාගත යුතුය.

02.03.01.02 සීමිත ලිඛිත තරග විභාගයේ විෂය නිර්දේශය.- සීමිත තරග විභාගය සඳහා පහත සඳහන් ප්‍රශ්න පත්‍රවලින් සමන්විත විභාගයක් පැවැත්වේ.

| | | |
|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | කාලය පැය 01 | ලකුණු 100 |
| සාමාන්‍ය දැනීම | කාලය පැය 01 1/2 | ලකුණු 100 |

03. ළදරු පාසැල් පාලිකා - II ශ්‍රේණිය

03.01 *වැටුප් පරිමාණය.*- රා. ප. ච. ලේ. 06/2006(IV)MN-1 හි වැටුප් පරිමාණයන් අනුව වාර්ෂික ඒකාබද්ධ රු. 157,440 - 1,740 x 10 - රු. 174,840.

03.02 *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :*

(අ) දෙවරකට නොවැඩි වාර ගණනක දී ගණිතය/අංක ගණිතය/හා සිංහල/දෙමළ භාෂාව/සාහිත්‍යය යන විෂයයන්ද ඇතුළුව සම්මාන සාමාර්ථ 03ක් සහිතව විෂයයන් 06කින් අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ජාතික පොදු සහතික පත්‍ර විභාගය හෝ සමත්ව තිබීම.

*සටහන.*- එම විභාගයේ දී චිත්‍ර කර්මය/සංගීතය/නැටුම් හා සෞන්දර්යය විෂයයන්ගෙන් සමත්වීම විශේෂ සුදුසුකමක් වනු ඇත ; සහ

(ආ) පූර්ව පාඨශාලා අධ්‍යාපන පිළිබඳ බී. එම්. අයි. සී. එච්. ආයතනයෙන් නිකුත් කරනු ලබන ඩිප්ලෝමා සහතිකය හෝ මියුසියස් ළදරු පාසැල් පාලනය පිළිබඳ ඩිප්ලෝමා සහතිකය හෝ ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ බාහිර සේවා මණ්ඩලය මගින් නිකුත් කරනු ලබන පූර්ව පාසැල් අධ්‍යාපනය පිළිබඳ ඩිප්ලෝමා සහතිකය හෝ වෙනත් රජයේ පිළිගත් ආයතනයක් මගින් නිකුත් කරනු ලබන ඩිප්ලෝමා සහතිකය.

03.03 *බඳවා ගැනීමේ ක්‍රමය.*- ලිඛිත තරග විභාගයේ ප්‍රතිඵලවල ප්‍රමුඛතාවය මත බඳවාගනු ලැබේ. තරග විභාගයේ ප්‍රතිඵල මත ප්‍රමුඛතා පරිදි කැඳවනු ලබන සම්මුඛ පරීක්ෂණක් මගින් සුදුසුකම් සනාථ කර ගැනීමෙන් පසු රජයේ ප්‍රතිපත්ති හා නියමයන් අනුගමනය කරමින් පුරප්පාඩු පුරවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබාදෙනු නොලැබේ. පත්වීම් ප්‍රදානයේ දී පත්වීම් දිය යුතු අවසාන ප්‍රමුඛතාවය ලබාගන්නාගේ ලකුණුවලට සමාන කීප දෙනෙකු සිටින අවස්ථාවක දී සම්මුඛ පරීක්ෂණයකින් අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් අනුව ඉහළම සුදුසුකම් ඇති පුද්ගලයා තෝරා ගැනේ.

ලිඛිත තරග විභාගයේ විෂය නිර්දේශය.- විවෘත විභාගය සඳහා පහත සඳහන් ප්‍රශ්නපත්‍රවලින් සමන්විත විභාගයක් පැවැත්වේ.

| | | |
|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | කාලය පැය 01 | ලකුණු 100 |
| ළදරු පාසැල් පාලනය පිළිබඳව | කාලය පැය 01 1/2 | ලකුණු 100 |

විභාගය සමත්වීම සඳහා එක් විෂයයකට අවම වශයෙන් ලකුණු 40% ලබාගත යුතුය.

*සටහන.*- බඳවාගනු ලබන්නේ කාන්තා පක්ෂයේ අයදුම්කාරියන් පමණි.

05. *අයදුම් කිරීමේ ක්‍රමය :*

1. නිවේදනයේ අග දක්වා ඇති ආදර්ශයට අනුව A4 (සෙ. මී. 21 x සෙ. මී. 29) ප්‍රමාණයේ කඩදාසි ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත්‍රය සකස් කළ යුතුය.
2. සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර 2010.02.15 දිනට පෙර "පළාත් පාලන කොමසාරිස්, පළාත් පාලන දෙපාර්තමේන්තුව, තැ. පෙ. 126, මහනුවර" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. දැනට රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් ඉල්ලුම්පත්‍ර තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් එවිය යුතුය. ඉල්ලුම්පත බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවර ඉල්ලුම් කරන තනතුර සටහන් කළ යුතුය.
3. අදාළ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් කැඳවනු ලබන අවසන් දිනට බඳවා ගැනීමේ මූලික සුදුසුකම් සපුරා නැති හා අසම්පූර්ණ එමෙන්ම ප්‍රමාද වී ලැබෙන ඉල්ලුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම්පත් තැපෑලේ දී නැතිවීම හා ප්‍රමාදවීම පිළිබඳව මෙම පළාත් පාලන දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.
4. අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්චයකාරවරයෙකු/දිවුරුම් කොමසාරිස්වරයෙකු/ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු/ත්‍රිවිධ හමුදාවේ අධිකාර බලයලත් නිලධාරියෙකු/පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු රු. 230,700ක් හෝ ඊට වැඩි වාර්ෂික වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික නිලධාරියෙකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

*සටහන.-* විභාග ගාස්තු ගෙවන ලද ලදුපත හැර වෙනත් තිසිදු ලියවිල්ලක් හෝ පිටපතක් ඉල්ලුම්පත්‍රය සමග නොඇමිණිය යුතුය.

06. *විභාග ගාස්තු.-* විභාග ගාස්තු වශයෙන් රුපියල් 600ක් මධ්‍යම පළාත් සභා ආදායම් ශීර්ෂ 20-03-20-39ට බැර වන පරිදි තමා පදිංචි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගෙවා ලබා ගන්නා ලදුපත අයදුම්පතට අමුණා එවිය යුතුය. මෙම මුදල් ගෙවා ලබාගත් ලදුපත හැර වෙනත් ආයතනයකට මුදල් ගෙවා ලබාගත් ලදුපත් හෝ මුදල් ඇණවුම් භාරගනු නොලබන අතර කුමන හේතුවක් නිසා හෝ ගෙවූ විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන බව ද සැලකිය යුතුය.

07. *සේවා කොන්දේසි හා නියමයන් :*

01. තනතුරු ස්ථිරය/විශ්‍රාම වැටුප් සහිතය.
02. ආයතන සංග්‍රහය මුදල් රෙගුලාසි පළාත් සභා මුදල් රීති, දෙපාර්තමේන්තු නියෝග හා විටින් විට රජය හා මධ්‍යම පළාත් සභාව විසින් නිකුත් කරන නියෝගවලටද යටත් විය යුතුය.
03. අයදුම්කරුවන් දණ්ඩ නීති යටතේ උසාවියකින් හෝ දඬුවම් නොලැබූ අයෙකු විය යුතුය.
04. විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.

08. *විභාග මධ්‍යස්ථානය.-* මෙම විභාග මහනුවර නගරය තුළ පැවැත්වීමට අපේක්ෂා කරනු ලැබේ. විභාගය ආරම්භවන දිනයේ අයදුම්කරුවන් විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුවේ.

09. *විභාගය පැවැත්වීම.-* ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව හෝ මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

10. මෙම විභාගය කල් දැමීම හා අවලංගු කිරීමේ බලය සහ මෙම දැන්වීමේ සඳහන් නොවන කරුණු පිළිබඳව තීරණ ගැනීමේ බලය මධ්‍යම පළාත් පාලන දෙපාර්තමේන්තුව සතුවේ.

*සංලක්ෂ්‍යය.-* රා. ප. ච. ලේ. 07/2007 විධිවිධාන අනුව 2007.07.01 දින සිට පළාත් රාජ්‍ය සේවයට බඳවා ගනු ලබන සියලුම නිලධාරීන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාවයක් සේවයට බැඳී වසර 05ක් තුළ ලබාගත යුතුය. රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව පවත්වන ප්‍රාරම්භක කුසලතා මට්ටමේ භාෂා පාඨමාලා පරීක්‍ෂණයෙන් සමත් විය යුතුය. (ලබා ගත යුතු ප්‍රවීණතා මට්ටම 03 වන කාණ්ඩය) පත්වීමේ දින සිට වසර 05ක් තුළ නියමිත දෙවන භාෂා ප්‍රවීණතාවය ලබා නොගන්නා නිලධාරීන්ගේ වැටුප් වර්ධක සුදුසුකම් ලබාගන්නා තෙක් විලම්භනය කරනු ඇත.

උපාලි අලහකෝන්,
පළාත් පාලන කොමසාරිස්,
මධ්‍යම පළාත.

2009 දෙසැම්බර් මස 23 වැනි දින,
මධ්‍යම පළාතේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***මධ්‍යම පළාත් සභා රාජ්‍ය සේවයේ ...................... තනතුර සඳහා අයදුම්පත්‍රය***

[ ]
(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

ඔබ විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය [ ]
සිංහල - 2, දෙමළ - 3, ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)
(මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ)

ඔබ පෙනී සිටින විභාගය
සීමිත [ ] විවෘත [ ]
(අදාළ කොටුව තුළ ✓ ලකුණ යොදන්න.)

01. (i) මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :——————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදාහරණය :- SILVA, A. B.
(ii) මුලකුරු අගට යොදා මුලකුරු සමග නම (සිංහලෙන්/දෙමළෙන්) :——————.
02. මුලකුරුවලින් හැඳින්වෙන නම් (සිංහලෙන්/දෙමළෙන්) :——————.
03. ස්ථිර ලිපිනය :——————.
04. (i) විභාග ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :——————.
(ii) විභාග ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :——————.
05. ස්ත්‍රී/පුරුෂ භාවය : [ ]
ස්ත්‍රී - 1, පුරුෂ - 0 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

06. විවාහක/අවිවාහක බව : ☐
අවිවාහක - 1, විවාහක - 2
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

07. උපන් දිනය :
වර්ෂය : ☐ මාසය : ☐ දිනය : ☐
අයදුම්පත් කැඳවන අවසන් දිනට වයස
අවුරුදු : ☐ මාස : ☐ දින : ☐

08. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

09. ශ්‍රී ලාංකික පුරවැසියෙකු වන්නේ උපතින් ද ?/ලියාපදිංචි වීමෙන් ද ? :——————.
(i) අයදුම්කරුගේ ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :——————.
(ii) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :——————.
(iii) ග්‍රාම නිලධාරි කොට්ඨාසය :——————.
(iv) පදිංචිව සිටින කාල සීමාව :.................... දින සිට .......................... දින දක්වා
අවුරුදු :——————. මාස :——————.

10. *අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් :*
(i) අ. පො. ස. (සා. පෙළ) විභාගය :——————.

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| 1. ............................ | ............................... | 5. ............................... | .................................. |
| 2. ............................ | ............................... | 6. ............................... | .................................. |
| 3. ............................ | ............................... | 7. ............................... | .................................. |
| 4. ............................ | ............................... | 8. ............................... | .................................. |

(ii) අ. පො. ස. (උ. පෙළ) විභාගය :——————.

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| 1. ............................ | ............................... |
| 2. ............................ | ............................... |
| 3. ............................ | ............................... |
| 4. ............................ | ............................... |

(iii) වෙනත් සුදුසුකම් :
අධ්‍යාපන :——————.
වෘත්තීය :——————.

11. අයදුම්කරු විසින් කරන ලද රැකියාවන් පිළිබඳ විස්තර (අදාළ වේ නම්) :

| *දෙපාර්තමේන්තුව/ආයතනය* | *දැරූ තනතුර* | *කාලය* | | *වාර්ෂික වැටුප* |
|---|---|---|---|---|
| | | *සිට* | *දක්වා* | |
| | | | | |

12. විභාග ගාස්තු රු. 600 ගෙවූ බවට අදාළ තොරතුරු :
(i) විභාග ගාස්තුව ගෙවූ ලදුපතේ අංකය :——————.
(ii) දිනය :——————.
(iii) ලදුපත ලබාගත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :——————.

ලදුපත නොගැලවෙනසේ මෙම කොටුව තුළ අලවන්න.
(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

13. (i) ඔබ ණයගැති භාවයෙන් බැඳී සිටින්නේ නම් ඒ කොපමණ ද ? :——————.
(ii) ඔබ කිසියම් සාපරාධී වරදකට උසාවියකින් දඬුවම් ලබා ඇති ද ? එසේ නම් විස්තර දක්වන්න :——————.

14. මෙම අයදුම්පතේ මවිසින් සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම විභාගය පිළිබඳව දක්වා ඇති කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දක්වා ඇතොත් විභාගයට පෙර හෝ පසුව මාගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කළ

හැකි බවත් තෝරා ගැනීමෙන් පසුව ඒ බැව් හෙළිවුවහොත් සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් දනිමි. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් මධ්‍යම පළාත් පාලන කොමසාරිස් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

——————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————.

**අයදුම්කරුගේ අත්සන සහතික කිරීම**

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ............................. මයා./මිය./මෙනෙවිය මා පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු/ඇය ................ වන දින මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත්. නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම ලදුපත ඉල්ලුම්පත්‍රයට අලවා ඇති බවත් සහතික කරමි.

——————,
සහතික කරන්නාගේ අත්සන.

දිනය :——————.
සහතික කරන්නාගේ නම :——————.
තනතුර හා නිල මුද්‍රාව :——————.

(මෙම සහතිකය රජයේ විදුහලක විදුහල්පතිවරයකු/සාමදාන විනිශ්චයකාරවරයකු/දිව්රුම් කොමසාරිස්වරයකු/ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියකු පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියකු හෝ රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික නිලධාරියකු විසින් සහතික කළ යුතුය.)

**රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ දැනට සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය**

මෙම අයදුම්කරු වන ...................................... මයා./මිය./මෙනෙවිය ............................. වශයෙන් දැනට ........................... කාර්යාලයේ/ආයතනයේ සේවය කරන බව ද, ඔහුගේ/ඇයගේ සේවය සතුටුදායක බව ද, පසුගිය වර්ෂවල වේතනාධික සියල්ල උපයාගෙන ඇති බව ද, ඔහු/ඇය මොනම ආකාරයක හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව ද මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකි/නොහැකි බව ද ඉහත සඳහන් කර ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව ද සහතික කරමි.

——————,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.
නම :——————.
තනතුර හා නිල මුද්‍රාව :——————.

දිනය :——————.

01-473

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.